# නර්තන

## විෂය නිර්දේශය

## 11 ශ්‍රේණිය

( 2016 සිට ක්‍රියාත්මකවේ)

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

**www.nie.lk**

පටුන


| | | |
|---|---|---|
| 1 | හැඳින්වීම | 01 |
| 2 | ජාතික පොදු අරමුණු | 02 |
| 3 | මූලික නිපුණතා | 03 - 05 |
| 4 | නර්තන විෂයයේ අරමුණු | 06 |
| 5 | නර්තන විෂය නිර්දේශය | 07 - 13 |

# සම්පත් දායකත්වය

උපදේශනය : මහාචාර්ය අබේරත්න බණ්ඩාර - අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.

ආචාර්ය මාම්බුල්ගොඩ සුමනරතන හිමි - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා මානව හා සමාජ විද්‍යා පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය.

අධ්‍යක්ෂණය : විශාරද සුදත් සමරසිංහ මයා - අධ්‍යක්ෂ, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

සම්බන්ධීකරණය : එස්. වර්ණසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විෂයමාලා කමිටුව

අභ්‍යන්තර : එස්. වර්ණසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

එච්. එම්. බි කල්‍යාණි මිය - කථිකාචාර්ය , සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

මරීනා ශිරන්ති ද සොයිසා මිය - කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

බාහිර : ගුණසේන රාජපක්ෂ මයා - විදුහල්පති, (විශ්‍රාමික) ගිරාගම ගුරු විදුහල.

කේ. සිරිල් මීගම මයා - නියෝජ්‍ය විදුහල්පති (විශ්‍රාමික) ශ්‍රී ගිරාගම ගුරු විදුහල.

ජේ. හෙට්ටිවත්ත මිය - කලාප අධ්‍යාපන කාර්යාලය හෝමාගම.

එම්. රණතුංග මයා - ගුරු උපදේශක, රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය, රුවන්වැල්ල.

ප්‍රියන්ති ප්‍රනාන්දු මිය - ගුරු සේවය, ක්‍රිස්තුරාජ විදුහල, තුඩැල්ල, ජාඇල.

යූ.පී. ප්‍රේමරත්න මයා - ස.අ.අ, කලාප අධ්‍යාපන කාර්යාලය, හලාවත.

ඩී.එන්.පී.එස්.ඩී. පෙරේරා මයා - ස.අ.අ., කලාප අධ්‍යාපන කාර්යාලය, කැලණිය.

කේ. සුසන්ත ගුණවර්ධන මයා - ස.අ.අ, කලාප අධ්‍යාපන කාර්යලය, පිළිමතලාව.

ජී.පී. රුක්මිණී අමරසිංහ මිය - ගුරු සේවය, මිග/නිව්ස්ටඩ් බා.ම.වි, මීගමුව.

සංස්කරණ මණ්ඩලය :

අභ්‍යන්තර - එස්, වර්ණසිංහ මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

එච්. එම් බී කල්‍යාණි මිය, කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

මරීනා ශිරන්ති ද සොයිසා මිය, කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමෙන්තුව.

බාහිර - මහාචාර්ය මුදියන්සේ දිසානායක, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අශෝකා දිසානායක මිය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

# හැඳින්වීම

2007 වසරේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව විෂයමාලා සංස්කරණය නිපුණතා පාදක ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් පාදක කොට ගෙන සකස් වී ඇත. එකී නිපුණතා පාදක සංකල්ප පෙරදැරි ව සැකසී ඇති 6 ශ්‍රේණිය විෂය නිර්දේශ 2015 වසරේ සිට ක්‍රියාත්මක වේ.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වාර්තාවලින් හා පාසල් හි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අධ්‍යයනයෙන් හෙළි වූ කරුණු අනුව නර්තන විෂයෙහි සංකල්ප හා විෂය අන්තර්ගතය සංස්කරණයට භාජනය කර ඇත. එහි දී වඩාත් අවධානය යොමු කළ කරුණු කීපයක් පවතී.

- පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා සිසුන්ගේ සහභාගිත්වය වැඩිදියුණු කිරීම.
- තාල අවබෝධය හා ප්‍රස්තාරකරණය පිළිබඳ කුසලතාව වර්ධනය කිරීම.
- චරිත නිරූපණය හා භාව ප්‍රකාශනය පිළිබඳ කුසලතාව වර්ධනය කිරීම.
- නර්තන, ගායන හා වාදන කලා අංග නිර්මාණකරණයට යොමු කිරීම.
- ජාතීන් අතර සහජීවනය සඳහා බහුවිධ සංස්කෘතික හරයන් ගොඩනැගීම (හඳුනා ගැනීම) හා පවත්වාගෙන යාම.

යහපත් සමාජයක් බිහිකිරීමට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා මෙන් ම චින්තන හැකියා, සමාජ හැකියා සහ පෞද්ගලික හැකියා වර්ධනය කරලීමටත් උසස් රසවින්දන ශක්තීන් හා කලා කෘතීන් විචාරයට ලක් කිරීමේ හැකියා වර්ධනය කරලීමත් අපේක්ෂා කෙරේ. ජාතික සංස්කෘතික උරුමයන් නොනැසී පවත්වාගෙන යාමට දායකවීමට අවශ්‍ය පසුබිම ගොඩනැගීමට අවශ්‍ය ශක්තිය වර්ධනය කිරීමට විශේෂයෙන් අවධානය යොමු කොට ඇත.

ක්‍රියාකාරකම් පාදක ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාවලිය වශයෙන් නූතන අධ්‍යාපන සංකල්ප හා මැනවින් අනුබද්ධ වී ඇත. එසේ සලකන විට නිපුණතා පාදක නව ප්‍රවේශය ඔස්සේ නර්තනය හා බැඳි කුසලතා කෙරෙහි අපේක්ෂිත සාධන මට්ටම් කරා සිසුන් ළඟා කරවීමට මෙමඟින් ඉඩකඩ සලසා දී ඇත.

# ජාතික පොදු අරමුණු

I	මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව  තහවුරු කිරීම.

I	වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III	මානව අයිතිවාසිකම් ගරු කිරීම. යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV	පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V	සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI	පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සිදහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII	ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII	ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

# මූලික නිපුණතා

අධ්‍යාපනයෙන් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සිදහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබිද දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

| | | |
|---|---|---|
| සාක්ෂරතාව | : | සාවධානව ඇහුම්කන් දීම පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සිදහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම. |
| සංඛ්‍යා පිළිබඳ දැනුම | : | භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සිදහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය. |
| රූපක භාවිතය | : | රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා෴ ආකෘති සහ වර්ණ ගළපමින් ස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම. |
| තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව | : | පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම |

(ii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා-

නිර්මාණශීලීබව, අපසාරී චින්තනය෴ ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැගීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා

- ඍජු ගුණය, ඉවසා දරා සිටිමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

| | | |
|---|---|---|
| සමාජ පරිසරය | : | ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය,බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා ,සාධාරණ යුක්තිය පිළිබිද හැගීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම් |
| ජෛව පරිසරය | : | සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා. |
| භෞතික පරිසරය | : | අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, තීන්ද්‍ර, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ. |

IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

- ආර්ථික සංවර්ධනයට දායක වීම.
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හිඳුනා ගැනීම.
- හැකියාවට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබාදීම.

# නර්තන විෂයයේ අරමුණු

- පරිසරයේ විද්‍යාමානවන ස්වභාවික වස්තූන් හා නිර්මිත කලාකෘතීන් හි සෞන්දර්යාත්මක වටිනාකම් හඳුනා ගැනීම, අගය කිරීම සහ ඒවා ආරක්ෂා කිරීම පිළිබඳ ආකල්ප වර්ධනය.

- නර්තන විෂය හා බැඳි ක්‍රියාකාරකම් වලින් වැඩ ලෝකයට මුහුණ දිය හැකි ක්‍රියාකාරිත්වය සහ උසස් ජීවන තත්ත්වයන් ගොඩනඟා ගැනීම සඳහා අවශ්‍ය සමාජීය හා පෞද්ගලික හැකියා වර්ධනය.

- නර්තන විෂය හැ බැඳි නිර්මාණ කෘති බිහිකිරීම මෙන් ම ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටලු සහගත අවස්ථාවන්හි දී නිර්මාණශීලී ව කටයුතු කිරීම සඳහා අවශ්‍ය නිර්මාණාත්මක චින්තනය සහ නිර්මාණ කුසලතා වර්ධනය.

- නර්තන විෂය හා බැඳි සංස්කෘතික පසුබිම පිළිබඳ ලබන අත්දැකීම් වලින් ජාතික සංස්කෘතික සාරධර්ම හා සෙසු සංස්කෘතීන් සතු හරයන් හඳුනා ගැනීම, අගය  කිරීම, ආරක්ෂා කිරීම පිළිබඳ මනා ආකල්ප වර්ධනය.

- විවිධ සන්නිවේදන මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කෙරෙන වැඩසටහන් අතරින් හරවත් හා යෝග්‍ය වැඩසටහන් තෝරා ගැනීම සඳහා අවශ්‍ය විචාර ශක්ති හා රසඥතා වර්ධනය.
- සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට අවශ්‍ය කායික හා මානසික සුව සම්පත් වර්ධනය.

# 11 ශ්‍රේණිය - නර්තන විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරුකර ගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.1 භාව ප්‍රකාශන වන පරිදි චරිත නිරූපණය කරයි. | • භාව ප්‍රකාශනය - ශාන්ත සිද්ධියක් ඇසුරෙන් | ශාන්ත භාවය ප්‍රකාශ වන පරදි චරිත නිරූපනය කරයි. | 03 |
| | 1.2 තේමාවක් අනුව චරිත නිරූපණය කරයි. | • විවිධ භාව ප්‍රකාශනය වන පරිදි තේමාවක් අනුව නර්තන මාධ්‍ය කොටගෙන චරිත නිරූපණය | සිද්ධියක් අනුව විවිධ භාව ප්‍රකාශවන පරිදි නර්තන මාධ්‍යයෙන් චරිත නිරූපනය කරයි. | 04 |
| | 1.3 ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණ කරයි. | • කඩු නැටුම/මෝල්ගස් නැටුම- සුවිශේෂ ලක්ෂණ, නර්තන නිර්මාණය | කඩු /මෝල්ගස් නැටුම හා බැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් ගැමි නැටුමක් නිර්මාණ කරයි. | 05 |
| 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.1 නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරමින් සරඹ ඉදිරිපත් කරයි. | • ගොඩ සරඹ/ ඉලංගම් සරඹ/ දොඹින පද 1-12 දක්වා කස්තිරම්/ ඉරට්ටි/හමාරපද සමගින්<br>• විලම්භ, මධ්‍ය සහ දෘත ලයට | සරඹ පද 1- 12 දක්වා විලම්භ, මධ්‍ය, දෘත ලයට නිවැරදි අංගහාර සහිතව ඉදිරිපත් කරමින් ඒවායේ අවසන් කිරීමේ පද ප්‍රදර්ශනය කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 ශිල්පීය විධික්‍රම අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | • මුසලඩි වන්නම/ ශුද්ධ තාලය/කොවුලා වන්නම<br>• 6 - 10 ශ්‍රේණි දක්වා ඉගෙන ගන්නා ලද සියලුම වන්නම්<br>• ආරම්භක පදය සමග කුදාංත ගතදොං වට්ටම මාත්‍රා දෙකක් කස්තිරම්, අඩව් සමග/<br>• ගුදගතිගත වට්ටමේ 3, 4 මාත්‍රා දෙකක් ඉරට්ටි සමග/<br>• පට්ටුතල් මාත්‍රය අලංකාර මාත්‍රා දෙකක් කලාසම්, අඩව් සමගින් | ගායනය සහිත හා රහිත නර්තන අංග ශිල්පීය විධික්‍රම අනුගමනය කරමින් ඉදිරිපත් කරයි. | 07<br>03 |
| | 2.3 ප්‍රස්තාරකරණයේ දී විධි ක්‍රම අනුගමනය කරයි. | • තුන් තිතේ ප්‍රභේද<br>• කඩු , මෝල්ගස්, ගුහපංති<br>• වන්නම්, වට්ටම්/පට්ටුතල් මාත්‍රය | තුන් තිතේ ප්‍රභේද හඳුනා ගනිමින් ගායනය සහිත හා රහිත නර්තන අංගයන්හි පද කොටස් විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.4 රස භාව සංකල්ප විස්තර කරයි. | රස භාව සංකල්පය | රස භාව සංකල්පය හඳුනාගනිමින් ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 02 |
| | 2.5 සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් පිළිබඳ තුලනාත්මක ව කරුණු දක්වයි. | • නර්තන අංග භාවිත වන අවස්ථා<br>• ගායන , වාදන , රංග වස්ත්‍රාභරණ , රංග උපකරණ තුලනාත්මක ව | සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් වල සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් එහි තුලනාත්මක ලක්ෂණ විස්තර කරයි. | 02 |
| | 2.6 නර්තන කලාව හා අනෙකුත් කලාවන් අතර සහ සම්බන්ධතාව විමසුමට ලක් කරයි. | • දෘශ්‍ය කලා<br>චිත්‍ර, නර්තන, සංගීත , නාට්‍ය | නර්තන කලාව හා අනෙකුත් කලාවන් අතර පවතින සම්බන්ධතාව විමර්ශනය කරමින් ඒවායේ භාවිත අවස්ථාවන් විස්තර කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.1 බෙර වාදනය හා සබැඳි මූලික සරඹ වාදනය කරයි. | • 1-3 බෙර සරඹ අභ්‍යාස | 1-3 බෙර සරඹ ශිල්පීය විධික්‍රම අනුගමනය කරමින් වාදනය කරයි. | 02 |
| | 3.2 නිවැරදි ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි. | • මැදුම් මහ දෙතිතට බෙර/දවුල් පද වාදනය<br>• 8 ශ්‍රේණියේ සිට ඉගෙන ගත් බෙර පද වාදනය | විවිධ තිත් රූපවලට බෙර පද වාදනය කරයි. | 04 |
| 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.1 ගායන හා සබැඳි සංස්කෘතික පසුබිම විස්තර කරයි. | • හටන් කවි, මෝල්ගස් කවි<br>• ග්‍රහ පන්ති, ප්‍රශස්ති, පන්තේරු කවි සහ වන්නම් | ගායන හා සබැඳි සංස්කෘතික හා සමාජීය වටිනාකම් විස්තර කරයි. | 06 |
| | 4.2 නියමිත නාදමාලාව අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරයි. | • හටන් කවි, මෝල්ගස් කවි<br>• ග්‍රහ පන්ති, ප්‍රශස්ති, පන්තේරු කවි සහ වන්නම් | නියමිත නාද මාලා අනුගමනය කරමින් විවිධ ගායන අංග ඉදිරිපත් කරයි. | 06 |

11 ශ්‍රේණිය - නර්තන විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැකගැනීම සඳහා ක්‍රියාකරයි. | 5.1 ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සබැඳි ඓතිහාසික පසුබිම විග්‍රහ කරයි. | • දේශීය වන්නම් වල පසුබිම හා විකාශනය<br>• නර්තන කලාවේ නූතන ප්‍රවණතා (1970 පසුව) | ශ්‍රී ලාංකේය නර්තනය හා සබැඳි ඓතිහාසික පසුබිම විස්තර කරයි. | 06 |
| | 5.2 ශ්‍රී ලාංකේය නර්තන කලාවේ සාහිත්‍ය කලා පෝෂණය සඳහා දායක වූ පර්යේෂණාත්මක ලේඛන පිළිබඳ තොරතුරු විස්තර කරයි. | • උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායට අයත් ලේඛන කෘති හඳුනා ගැනීම<br>- මහාචාර්ය, මුදියන්සේ දිසානායක<br>- මහාචාර්ය, ජයසේන කෝට්ටගොඩ<br>- මහාචාර්ය, තිස්ස කාරියවසම්<br>- ආචාර්ය, ශ්‍රියානි රාජපක්ෂ | දේශිය නර්තන සම්ප්‍රදායන්ට අයත් ලේඛන කෘති හඳුනා ගනිමින් තොරතුරු ඉදිරිපත් කරයි. | 02 |
| | 5.3 ශ්‍රී ලාංකේය ගැමි නාටක හා සබැඳි පසුබිම අධ්‍යයනය කර සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි. | • කෝලම් නාටකය | ශ්‍රී ලාංකේය ගැමි නාටකවල සුවිශේෂ ලක්ෂණ අධ්‍යයනය කර තොරතුරු ඉදිරිපත් කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.1 රූපවාහිනි නාලිකා වල දක්නට ලැබෙන නර්තන අංග විචාරයට ලක් කරයි. | • රූපවාහිනි නාලිකා වල දක්නට ලැබෙන අධ්‍යයතන නර්තන වැඩසටහන් | ශ්‍රි ලංකාවේ රූපවාහිණියේ විකාශය වන නර්තන අංග නරඹා එහි කලාත්මක වටිනාකම් විචාරය කරයි. | 02 |
| | 6.2 වෙනත් සංස්කෘතියකට අයත් නර්තන සම්ප්‍රදායන් අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි. | • මනිපුරි නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ, සංගීතය, වාද්‍ය භාණ්ඩ, නර්තන අංග, රංග වස්ත්‍රාභරණ සහ අංග රචනය | භාරතීය නර්තන සම්ප්‍රදායෙහි සංස්කෘතික, සමාජීය හා කලාත්මක වටිනාකම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 04 |
| 7.0 විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් ප්‍රාසංගික කලාංග නිර්මාණ කරයි. | 7.1 ප්‍රාසංගික නර්තන අංගයක් නිර්මාණ කරයි. | • විජයතුමා තම්මැන්නේ / වාසනා දිනේක මේක ගීතයට නර්තන නිර්මාණය | ගීතයක පසුබිම අධ්‍යයනය කර ප්‍රාසංගික නර්තන අංගයක් නිර්මාණ කරයි. | 04 |
| | 7.2 ප්‍රාසංගික ලක්ෂණ ප්‍රදර්ශනය වන පරිදි අංග රචනය කරයි. | • නර්තන අංගයක් සඳහා අංග රචනය | අංග රචනයේ සුවිශේෂතා අධ්‍යයනය කරමින් නර්තන අංගයක් සඳහා අංග රචනය කරයි. | 03 |

| **නිපුණතාව** | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 නර්තන කලාවෙන් ලැබෙන මානසික හා ශාරීරික සුව සම්පත සාර්ථක දිවි පෙවෙතක් ගතකිරීමට ඉවහල් කර ගනියි. | 8.1 නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කරගත් පුද්ගල වටිනාකම් අගයමින් විස්තර කරයි. | • රසඥතා වර්ධනය<br>• සාර්ථක දිවිපෙතෙක් ගත කිරීමට | නර්තන කලාව හැදෑරීමේ වැදගත්කම හඳුනාගනිමින් සාර්ථක දිවිපෙවතක් ගත කිරීම සඳහා ඒවා භාවිතයට ගත හැකි අයුරු විමසයි. | 03 |
| | 8.2 නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කර ගන්නා සමාජයීය වටිනාකම් පිළිබඳ අදහස් දක්වයි. | • සහජීවනය හා නායකත්ව ගුණාංග<br>• අන්තර්ජාතික සබඳතා<br>• සමාජ සම්බන්ධතා<br>• වේදිකා ප්‍රසංග | නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කරගන්නා සමාජයීය වටිනාකම් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි. | 04 |
| | | | | 86 |